Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ගිණුම්කරණය

සතිය- 5

ශ්‍රේණිය-13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

## නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

භාණ්ඩයක් හෝසේවාවක් නිෂ්පාදනයට අදාල ක්‍රියාවලිය අරබන ලද අවස්ථාවේ සිට එය නිම කරන තෙක් දරන සියලු පොදු කාර්ය පිරිවැය වල එකතුවයි.( වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය+ වක්‍ර වෙනත් පිරිවැය)

මේවා නිෂ්පාදන ඒකකයට සෘජුව හදුනාගත නොහැකි බැවින් පහත පරිදි බෙදාහැරීම කල යුතු වේ.

**නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය බෙදාහැරීමේ ක්‍රියාවලිය.**

නිෂ්පාදිතය වෙනුවෙන් පිරිවැය රැස් කරන සෑම පිරිවැය මධ්‍යස්ථානයකටම පිලිගත් ක්‍රමයකට අනුව පොදු කාර්ය පිරිවැය බෙදාහැරීමේ ක්‍රියාවලිය පහත පරිදි පියවර 4 කින් සමන්විතය.

**පියවර 01)** පොදු කාර්ය පිරිවැය රැස්කිරීම ඒ ඒ වක්‍ර පිරිවැයට අදාල මූලාශ්‍ර ලියවිලි මගින් විවිධ පිරිවැය මධ්‍යස්ථාන ආශ්‍රිතව සිදු වේ.

**පියවර 02)** පොදු කාර්ය පිරිවැය ප්‍රතිපාදනය. ඒ ඒ පිරිවැය මධ්‍යස්ථාන වලට අදාලව පැහැදිලිව වෙන්කර හදුනාගත හැකි පොදු කාර්ය පිරිවැය ඒ එක් එක් පිරිවැය මධ්‍යස්ථානයට ඇතුලත් කිරීමයි.නිදසුන් ලෙස *ඒ ඒ පිරිවැය මධ්‍යස්ථානයට වෙන වෙනම විදුලි බිල් වැටුප් ලේඛණ පැවතීම.*

**පියවර 03)** පොදු කාර්ය පිරිවැය විභජනය පහත පරිදි අදියර 02 කි.

1- ප්‍රාථමික විභජනය - පැහැදිලිව වෙන්කර හදුනාගත නොහැකි පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන හා සේවා මධ්‍යස්ථාන අතර සාධාරණ පදනමක් මත බෙදාහැරීමයි.

2- ද්වීතීයික විභජනය - සේවා මධ්‍යස්ථාන වලට ඇතුලත් කරන ලද පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන අංශ වලට සාධාරණ පදනමක් මත නැවත බෙදාහැරීමයි.

**ඇගයීම - පහත දී ඇති** නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය විභජන පදනම් ( විවිධ පිරිවැය මධ්‍යස්ථාන සදහා පොදු මූලාශ්‍ර ලියවිලි ඇති විට) සහ ඉහත නිෂ්පාදන පොදු

කාර්්‍ය පිරිවැය බෙදාහැරීමේ ක්‍රියාවලිය ඇසුරින් **මයුර ඇඟලුම් ව්‍යාපාරයේ** අසම්පූර්ණ නිෂ්පාදන පොදු කාර්්‍ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

**පිරිවැය අයිතම**

**විභජන පදනම**

. ගෙවල් කුලී, වරිපනම්, ගොඩනැගිලි නඩත්තු, විදුලිය ,ආලෝකය
වර්ගඵලය/ බිම් ප්‍රමාණය
. ජල, විදුලි, දුරකථන බිල්පත්
පාවිච්චි කළ ඒකක
. ආපන ශාලා වියදම්, වක්‍ර වැටුප්, සේවක රක්ෂණ, වෛද්‍ය වියදම්
සේවක සංඛ්‍යාව
. යන්ත්‍ර ක්ෂය, යන්ත්‍ර රක්ෂණය, යන්ත්‍ර කුලී යන්ත්‍ර පිරිවැය/ධාරණ අගය
. ගබඩා වියදම් ද්‍රව්‍ය අධියාචනාපත් ප්‍රමාණය
. නඩත්තු වියදම්
නඩත්තු පැය ගණන

## පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

| | | | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තු |
|---|---|---|---|---|---|
| **පොදුකාර්ය පිරිවැය අයිතමය** | **මුළු වටිනාකම (රු.000)** | **විභජන පදනම** | **මැසීම් අංශය** | **නිමැවුම් අංශය** | **නඩත්තු අංශය** |
| සුපරීක්ෂක වේතන - මැසීම් අංශය | 820 | | | | |
| සුපරීක්ෂක වේතන - නිමැවුම අංශය | 480 | | | | |
| නඩත්තු වේතන | 190 | | | | |
| විදුලිය | 240 | | | | |
| ගොඩනැගිලි කුලී | 180 | | | | |
| යන්ත්‍ර ක්ෂය | 150 | | | | |
| සේවක රක්ෂණ | 300 | | | | |

අතිරේක තොරතුරු

| **විස්තරය** | **මැසීම් අංශය** | **නිමැවුම් අංශය** | **නඩත්තු අංශය** | **එකතුව** |
|---|---|---|---|---|
| කිලෝ වොට් පැය | 1500 | 600 | 300 | 2400 |
| යන්ත්‍ර පිරිවැය | 1000 000 | 500 000 | | 1500 000 |

| | | | | |
|---|---|---|---|---|
| බිම් ප්‍රමාණය -වර්ග මීටර් | 200 | 100 | 60 | 360 |
| සේවක සංඛ්‍යාව | 25 | 100 | 25 | 150 |
| නඩත්තු පැය | 60 | 40 | | 100 |